දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாய"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................................

මගේ අංකය / எனது இல. / My No. } ඊඩී/ 9/ 102/ 29

දිනය / திகதி / Date } 2016.01.01

චක්‍රලේඛ අංක :- 05/ 2016

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පරිවේණාධිපතිවරුන් හා
විදුහල්පතිවරුන්
අධ්‍යාපන අමාත්‍යාංශය හා අනුබද්ධ සියලු ම ආයතන ප්‍රධානීන් වෙත,

**ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය නිසා සිදු වී ඇති සෘජු හා වක්‍ර සෞඛ්‍ය, පාරිසරික හා සමාජීය බලපෑම් අවම කර ගැනීම සඳහා යෝජිත වැඩසටහන ක්‍රියාවට නැංවීම**

අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ අවධානය යොමුවී ඇති ප්ලාස්ටික්/ පොලිතීන් භාවිතය නිසා සිදුවන සමාජීය, සෞඛ්‍යමය හා පාරිසරික බලපෑම් අවම කිරීම සඳහා පිළියෙල කරන ලද පරිසර සංරක්ෂණ වැඩසටහන 2016 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කළ යුතු ය.

මෙම වැඩසටහනෙහි හඳුනාගෙන ඇති එක් ක්‍රියාමාර්ගයක් ලෙස 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ 2006 ඔක්තෝබර් 10 දින නිකුත් කරන ලද අංක 1466/ 5 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය පරිදි ඝනකමින් මයික්‍රෝන විස්ස(20)ක් හෝ ඊට අඩු පොලිතීන් හෝ පොලිතීන් නිෂ්පාදන දේශීය භාවිතය සඳහා නිෂ්පාදනය කිරීම, විකිණීම හෝ භාවිත කිරීම තහනම් වේ.

01.) පොලිතීන් භාවිතය අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ඉහත රෙගුලාසි දැනටමත් ක්‍රියාත්මක වන අතර ඒ හා සමගාමීව පාසල්, පිරිවෙන්, කොට්ඨාස/ කලාප/ පළාත් අධ්‍යාපන කාර්යාල, අධ්‍යාපන විද්‍යාපීඨ හා අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ සියලු ම ආයතන තුළ පොලිතීන් භාවිතය අවම කිරීම අත්‍යවශ්‍ය වේ.

ඒ අනුව 2016 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි පහත ක්‍රියාකාරකම් ඔබ ආයතනය තුළ ක්‍රියාත්මක විය යුතු ය.

01. දැනට තහනම් කර ඇති මයික්‍රෝන 20ක් හෝ ඊට අඩු පොලිතීන් බෑග් හා ආහාර දැවටුම් පාසල්/ ආයතන තුළට රැගෙන ඒම තහනම් කිරීම සහ පාසල්/ ආයතන තුළ ඇති ආපනශාලා, වෙළෙඳසැල්වල ඉහත නිෂ්පාදන විකිණීම තහනම් කිරීම

02. පාසල් සිසුන්, ගුරුභවතුන්, විදුහල්පතිවරුන්, නිලධාරීන් හා අනධ්‍යයන කාර්යමණ්ඩල විසින් පාසල්/ ආයතන පරිශ්‍ර තුළට මයික්‍රෝන 20ක් හෝ ඊට අඩු පොලිතීන් බෑග් හා අනෙකුත් ද්‍රව්‍ය සහ ප්ලාස්ටික් රැගෙන ඒම හැකි තරම් පාලනය කිරීම සහ එවැනි ද්‍රව්‍ය විකිණීම පාලනය කිරීම

03. සිසු දරුවන් හරහා, ආහාර රැගෙන ඒම සඳහා විකල්ප ඇසුරුම් ක්‍රමවේද හෝ නැවත භාවිත කළ හැකි හෝ දිරායන ඇසුරුම් භාවිත කිරීමේ ක්‍රමවේද දිරිගැන්වීම

04. ප්ලාස්ටික් හා පොලිතීන් මලූ විවෘත දහනය සිදු කිරීම තුළින් දිගුකල් පවත්නා කාබනික දූෂක (POPs), ඩයොක්සීන් සහ ෆියුරාන් වැනි කුඩා ළමුන්ට ඉතාමත් අහිතකර ද්‍රව්‍ය/ විෂ වායු නිකුත් කෙරෙන බැවින් ඒවා, ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානවලට යොමු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු යෙදීම

05. ඉහත කරුණු සම්බන්ධයෙන් සියලු ම පළාත්/ කලාප අධ්‍යාපන කාර්යාල මගින් සියලු ම පාසල් සිසුන්, ගුරුභවතුන් හා අනෙකුත් කාර්ය මණ්ඩල දැනුවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

06. පාසල් සිසුන් සහ ගුරුභවතුන් සහභාගි කර ගනිමින් පාසලින් පරිබාහිරව සිදු කරනු ලබන සියලු ම ක්‍රියාකාරකම්වල දී ඉහත 1 සිට 4 දක්වා කරුණු සඳහා අනුගත වීමට අවශ්‍ය උපදෙස් ඔවුන් වෙත ලබා දීම

02.) වැඩසටහන සම්බන්ධීකරණය, අධීක්ෂණය හා නියාමනය

මෙම වැඩසටහන නියාමනය හා ඇගයීම ආයතන මට්ටමින් සිදු කළ යුතු අතර, පාසල්වල විදුහල්පති, පරිසර සංගමය, පරිසර කටයුතු භාර ගුරුභවතුන්, කලාප හා පළාත් පරිසර/ කෘෂිකර්ම/ විද්‍යා විෂය භාර අධ්‍යාපන නිලධාරීන් විසින් සිදු කළ යුතු වේ.

මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලු ම දෙනා සක්‍රිය ව සහභාගි වනු ඇතැයි අපේක්ෂා කරමි.

ඩබ්.එම්. බන්දුසේන
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :

01. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය - කරු.දැ.ගැ.පි.
02. ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය - කරු.දැ.ගැ.පි.
03. අතිරේක ලේකම්වරුන් - අධ්‍යාපන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.පි. හා අ.ක.ස.
04. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය - කරු.දැ.ගැ.පි. හා අ.ක.ස.
05. විභාග කොමසාරිස් ජනරාල් - විභාග දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.පි. හා අ.ක.ස.
06. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව- කරු.දැ.ගැ.පි. හා අ.ක.ස.
07. විද්‍යාපීඨ ප්‍රධාන කොමසාරිස් - අධ්‍යාපන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.පි. හා අ.ක.ස.
08. පරිසර ව්‍යාපෘති අධ්‍යක්ෂ, ජනාධිපති කාර්ය සාධක බලකාය, ජනාධිපති ලේකම් කාර්යාලය - කරු.දැ.ගැ.පි.
09. අධ්‍යාපන අධ්‍යක්ෂ/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.පි. හා අ.ක.ස.
10. නි.අ.අ./ස.අ.අ. (කෘෂි)/ (විද්‍යා) - පළාත් හා කලාප අධ්‍යාපන කාර්යාලවල වැඩසටහන ක්‍රියාත්මක කිරීම, නියාමනය හා ඇගයීම සඳහා